# මිත්තා මිත්ත ජාතකය

තවද හුදු නුවණින් මවාළු රුවක් වැනිවූ තිලෝගුරු බුදුරජානන් වහන්ස් ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ අමාත්‍යයකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

කොසොල් රජ්ජුරුවෝ එක් අමාත්‍යයෙකුට බොහෝ සම්පත්දී අධික කරුණා ඇත්තාහ. සෙසු අමාත්‍යවරු රජ්ජුරුවන් අමාත්‍යයාට අධික කරුණා ඇතිනියාව දූන නොයෙක් දොෂකියා බිඳවාපුවාහ. රජ්ජුරුවෝ අමාත්‍යයාගෙ දොෂ පරීක්ෂා කොට කිසි දොශයක් නැතියෙහින් බුදුරජානන් වහන්සේ කරාගොස් ස්වාමිනි මිත්‍රයාගේ යහපත හා අමිත්‍රයාගේ දොෂත් අසනු කැමැත්තෙමි කීහ. මහරජ පළමුත් තොපගේ රජ දරුවෝ නුවනැත්තන් අතින් විචාළගමනේ නුවණැත්තෝ විසඳා කිව්වෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට පණ්ඩිත අමාත්‍යය උපන්නාහ. ඒ රජ්ජුරුවෝ එක්තරා අමාත්‍යයෙකුට අධික කරුණා ඇත්තාහ, සෙසු අමාත්‍යවරුත් ඒ අමාත්‍යයකෙරෙහි ඊරිස්සාව බැඳි නොයෙක් දොෂ රජ්ජුරුවෙන්ට කියා බිඳවූහ. රජ්ජුරුවෝත් ඒ අසා අමාත්‍යයාගේ දොෂ පරීක්‍ෂා කොට කිසි දොශයක් නොදක සිතන්නාහ. මිත්‍රයාගේ යහපතින් අමිත්‍රයාගේ දොෂයත් පණ්ඩිත අමාත්‍යයාගෙන් අසනු කැමැත්තෙමි කියා ගෙන්වා විචාරන්නාහු මේ ලෝකයෙහි නුවැණැත්තාවූ සත්වතෙමේ කෙසේ වූ කාරියක් කරන්නාවූ සත්වයා ඇසින් දකවත් කණින් අසාවත් මේ මට අමිත්‍රයයි දූනගණිද ඒ මිත්‍රයයි දූනගණිද ඒ මිත්‍රයා දූනගන්නා පිණිස නුවණැත්තාවූ සත්වතෙමේ කෙසේ වීර්ය කෙරේදැයි විචාලාහ. එබස් අසා රජ්ජුරුවන්ට අමිත්‍ර ලක්ෂණ කියන්නාහු බෝධිසත්වයෝ මහරජ්ජුරුවන් වහන්ස මිත්‍ර ප්‍රතිරූපකවූ සත්වතෙමේ මිත්‍රවූ දක සන්තෝෂාකාරයක් නොදක්වා ද ඒ මිත්‍රයාගේ කථා පිළිගෙණ සතුටු නොවේද මිත්‍රයා තමා මූන බැළු අවස්ථාවෙහි තෙමේ මූන බලාද මිත්‍රයාගේ කථාවට විරුද්ධ වේද ඔහුගේ සතුරන් භාජනය කෙරේද මිත්‍රයාගේ බලවත් කාර්යයකට වර්ණනානොකෙරේද ඔහුගේ ප්‍රඥාවට ප්‍රසංසා නොකෙරේද මිත්‍රයාට අවැඩක්වූ කල්හි සතුරන් සේ සතුටුවේද වැඩක්වූ කල්හි නොසතුටුවේද නොලදහැකි භොජනයක් ලත්කල්හි මිත්‍රතෙම මෙයින් ස්වල්පදෙයක් ලද්දේ නම් යහපතැයි ඔහු සිහි නොකෙරේද යන මේ කාරණා සොළොස්දෙන අමිත්‍රයා කෙරෙහි පිහිටියාහ. නුවනැත්තාවූ සත්වතෙම මේ සොළොස් ආකාරයෙන් අමිත්‍රයා දූකත් ඔහුගේ ගුණ අසාත් අමිත්‍ර ලක්ෂණ දූනගන්නේයයි රජ්ජුරුවන්ට අමිත්‍ර ලක්ෂණ කීහ. නැවත රජ්ජුරුවන් විසින් නුවනැත්තාවූ සත්වතෙමෙ කෙසේවූ කාරියක් කරන්නාවූ පුද්ගලයා ඇසින් දූකත් ඔහුගේ කාර්යය අසාත් මේ මිත්‍රයතා යයි දූනගණිද ඔහු මිත්‍ර නියාව දූනගන්නට කෙසේ උත්සාහ කෙරේදැයි විචාළ කල්හි මිත්‍රලක්ෂණ කියන්නාවූ බෝධිසත්වයෝ මහ රජ්ජුරුවන් වහන්ස මිත්‍ර තෙම තමාගේ මිත්‍රයා අන්‍යදෙශයකට ගිය කල්හි ඇමවෙලෙහිම සිහිකෙරේද බැහැර ගොස් ආතැනැත්තවූ දූක සතුටු වේද ඔහු කෙරේද මිත්‍රයන්ගේ මිත්‍රභජනය කෙරේද මිත්‍රයාගේ නුගුණ කියන්නාවුන් වලකා ගුණ කියන්නාවුන්ට ප්‍රසංසා කෙරේද තමාගේ රහස් මිත්‍රයාට කියාද ඔහුගේ රහස් තෙමේ සඟවාද මිත්‍රයාගෙන් ස්වල්ප මාත්‍රවූ දෙයක් ලද්දේ නම් ඊට වර්ණනා කෙරේද ඔහුගේ ප්‍රඥාවට ප්‍රසංශා කෙරේද මිත්‍රයාට වැඩක්වූ කල්හි සතුටුවේද අවැඩක්වූ කල්හි දෝමිනස්වේද නොලද ආහාර පාණවර්ගයයක් ලත් කල්හි මාගේ මිත්‍රතෙම මේ භෝජනයෙන් ස්වල්ප මාත්‍රයක් ලද්දේ නම් යහපත් වන්නේයයි ඔහු සිහිකොට අනුභව කෙරේදැයි යන මේ කාරණ සොළොස මිත්‍රයා කෙරෙහි මානව පිහිටියේය. නුවනැත්තාවූ සත්වතෙමෙ මේ මිත්‍රයා දූකත් ඔහුගේ කාර්යය අසාත් මේ සොළොස්කාරණයෙන් මිත්‍රලක්ෂණ දූනගන්නේයයි මහබෝසතානෝ රජ්ජුරුවන්ට මිත්‍රයාගේ ලක්ෂණ ප්‍රකාශකොට කීහ. රජ්ජුරුවෝ මහබෝසතානන්ගේ බසට සතුටුව මහත්වූ ඓශ්චර්යය දුන්නාහ. ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාල මෙසේ මහරජ්ජුරුවෙනි පෙරත් මිත්‍ර අමිත්‍රව දෙදෙනාගේ ලක්ෂණ දූනගන්නට සුදුසුවූ ප්‍රශ්න පහළවිය. එසමයෙහි නුවණැත්තෝම ප්‍රශ්න විස්සජ්ජනය කොට මෙයාකාරයෙන් මිත්‍ර අමිත්‍ර දෙදෙනාගේ ලක්ෂණ දතයුතුයයි කිවෝ වේදැයි වදාරා මේ මිත්තාමිත්ත ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් දූන් ආනන්ද ස්ථවිරයයෝය. එසමයෙහි නුවණැත්තාවූ අමාත්‍යයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජු වූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.